# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2258/13 - 2021 දෙසැම්බර් මස 14 වැනි අඟහරුවාදා - 2021.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු ආඥාපනත (235 වන අධිකාරය)**

රේගු නිවේදනය - අංක 3/2021 - කැටුව නොයන මඟී ගමන් බඩු බැඳුම්කර ගුදම්

235 වන අධිකාරය වූ රේගු ආඥාපනතේ 69 වන වගන්තිය මගින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරනු වස්, රේගු අධ්‍යක්ෂ ජනරාල් ගංවාරිගේ විජිත රවිප්‍රිය වන මම, එම වගන්තියෙන් ගරු මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී අමාත්‍යවරයා විසින් දෙන ලද අනුමැතිය පරිදි හා එතුමාගේ නියමය අනුව, මෙහි දක්වා ඇති උපලේඛනයෙහි 03 වන තීරුවේ සඳහන් ගුදම් හා ආරක්ෂිත ස්ථාන කැටුව නොයන මඟී ගමන් බඩු බැඳුම්කර ගුදම් වශයෙන් අනුමත කර නියම කරන අතර, එකී ස්ථානවල තීරු ගාස්තු ගෙවීමකින් තොරව භාණ්ඩ ගුදම්ගත කිරීම, තබා ගැනීම හෝ ආරක්ෂිතව තබා ගැනීමට හැකි බව මෙයින් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර සිටිමි.

**විශ්‍රාමික මේජර් ජනරාල් ජී. වී. රවිප්‍රිය,**
රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගුව,
රේගු මන්දිරය,
අංක 40, කෙළින් වීදිය,
කොළඹ 11.
2021 දෙසැම්බර් මස 10 වැනි දින දී ය.


1A - G 35561 -16 (2021/12)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනය

| අංකය | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|
| | *බැඳුම්කර ගුදම හිමිකරුගේ නම සහ ලිපිනය* | *බැඳුම්කර ගුදමෙහි ලියාපදිංචි අංකය* | *බැඳුම්කර ගුදම පිහිටි ස්ථානය* | *බැඳුම්කර ගුදමෙහි ස්වභාවය* | *බැඳුම්කර ගුදමෙහි විශාලත්වය* | *ගුදම්ගත කිරීමට අවසර ඇති භාණ්ඩ* |
| 1 | සෙරන්ඩිබ් ලොජිස්ටික්ස් වර්ල්ඩ් වයිඩ් (පුද්ගලික) සමාගම අංක 51, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07. | බීඩී/පීබී/1124 | අංක 973/30, කඩොල් කැලේ වත්ත, ලියනගේමුල්ල, සීදූව | කැටුව නොයන මගී ගමන් බඩු බැඳුම්කර ගුදම් | ව. අඩි 11,520 | කැටුව නොයන මගී ගමන් බඩු |

EOG 12 - 0137

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.